# කෙටි චිත්‍රපට තරඟාවලිය

එය ආරම්භ වන්නේ තිර පිටපතකිනි

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය, කෙටි චිත්‍රපට තරගාවලියක් පැවැත්වීමට කටයුතු සම්පාදනය කර ඇති අතර දූෂණය මැඩලීම පිලිබඳ  තේමාවන් තුනක් යටතේ තිර පිටපත් යොමු කිරීමට, මේ සඳහා කැමැත්තක් දක්වන පුද්ගලයන්ට හෝ කණ්ඩායම් වලට ආරාධනා කර සිටී. සිනමා ක්ෂේත්‍රයේ කීර්තිමත් ප්‍රවීණයන් කිහිප දෙනෙකුගෙන් සමන්විත විනිශ්චය මණ්ඩලයක් මගින් තිර රචනාවන් තොර ගැනීම සිදු කරනු ඇති අතර ජයග්‍රාහී තිර රචනා නිෂ්පාදනයටත් , මහජන ප්‍රදර්ශනයත් සිදු කර දෙනු ලැබේ. TISL දේශීය චිත්‍රපට ක්ෂේත්‍රයේ කුසලතා පරිපූර්ණ පිරිස් වැඩි දුරටත් ඔප්නැංවීමටත්, අල්ලස හා දූෂණයට එරෙහිව අරගල කල යුතුය යන පණිවිඩය චිත්‍රපට කරමාන්තය හරහා සමාජගත කිරීමටත් බලාපොරොත්තු වේ.

එක් එක් තේමාව යටතේ එක් ජයග්‍රාහී තිර රචනාවක් පමණක් නිෂ්පාදනය සඳහා තෝරාගනු ඇත. තරගාවලිය සඳහා එක අයදුම්කරුවෙකුට යොමු කල හැක්කේ එක් තිර පිටපතක් පමණි. මූලික තිර පිටපත යොමු කිරීමෙන් අනතුරුව, කෙටි ලැයිස්තු ගත කරනු ලබන අයදුම්කරුවන්ට, අල්ලස හා දූෂණය මැඩලීමේ යාන්ත්‍රනයන් පිලිබඳ පවත්වනු ලබන වැඩමුළුවක් සඳහා ආරාධනා කරනු ඇත. මෙම වැඩමුළුවේදී , චිත්‍රපට ක්ෂේත්‍රයේ ප්‍රවීනයන් තිදෙනෙකු සිය අත්දැකීම් සහභාගීවන්නන් සමග හුවමාරු කර ගැනීමට නියමිතයි.

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා අල්ලස හා දූෂණය මැඩලීම වෙනුවෙන් ගෝලීයව ක්‍රියාත්මක වන ප්‍රමුඛතම ආයතනය වන ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් හි දේශීය ශාඛාවයි . ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ආයතනය, අල්ලස හා දූෂණයේ හානිකර බලපෑම පිලිබඳව දැනුවත් කිරීම් සිදු කරන අතරම, ඒවා පාලනය කිරීම සඳහා ඵලදායි ක්‍රියාමාර්ගයන් වැඩිදියුණු කිරීමත් ක්‍රියාත්මක කිරීමටත්, රාජ්‍ය පාර්ශවකරුවන්, ව්‍යාපාර ක්ෂේත්‍රය හා සිවිල් සමාජය සමග කටයුතු කරයි.

**තිර රචනා සඳහා තේමාවන්**

තිර රචනාවන්, පහත සඳහන් එක් තේමාවක් යටතේ රචනා විය යුතුය.

**1. අල්ලස හා දූෂණය පිටු දැකීමේදී තරුණ පරපුරේ භූමිකාව**

කිසියම් රටක අල්ලස හා දූෂණයට එරෙහිව කටයුතු කිරීමේදී තරුණ ප්‍රජාව වෙත පැවරී ඇත්තේ මගහැරිය නොහැකි වගකීමකි. 2018 ග්ලෝබල් කරප්ෂන් බැරෝමීටර් සමීක්ෂණය අනුව ශ්‍රී ලංකාවේ තරුණ ප්‍රජාවෙන් 80%ක් පමණ, අල්ලස හා දූෂණය, රටේ පාලනය තුල පවතින ප්‍රධාන ගැටළුවක් බවට හඳුනා ගෙන ඇත. මෙම තේමාව යටතේ යොමුකරනු ලබන තිර රචනාවන්, අල්ලස හා දූෂණයට එරෙහිව තරුණ ප්‍රජාවට ක්‍රියාකාරීව සටන් වැදිය හැකි විවිධ මාධ්‍යන්, උදාහරණ වශයෙන්, තොරතුරු දැනගැනීමේ පනත භාවිතා කිරීම, දැනුවත් කිරීම් උදෙසා සමාජ මාධ්‍ය භාවිත කිරීම,අල්ලස් හෝ දූෂණ විමර්ෂණ චෝදනා කොමිෂන් සභාව හා සම්බන්ධ වී කටයුතු කිරීම වැනි දෑ කෙරෙහි අවධානය යොමු කරමින් නිර්මාණය කල යුතුය,.

**2. අල්ලස හා දූෂණය කාන්තාව කෙරෙහි අසාධාරණ ලෙස ඇති කරන බලපෑම**

අල්ලස හා දූෂණය විවිධ සමාජ කණ්ඩායම් වෙත එල්ල කරන බලපෑම විවිධාකාර වේ. මෙවැනි අසමාන වූ බලපෑම් නිසි පරිදි හඳුනාගැනීම ඒවාට විසඳුම් සෙවීමට ඇති හොඳම මාර්ගයයි. කාන්තාව අල්ලස හා දූෂණයට සම්බන්ධ අවස්ථාවන්ට මුහුණ දීමේදී අද්දකින දෑ, උදාහරණ වශයෙන් ලිංගික අල්ලස්,කාන්තාවන් දේශපාලනිකව ක්‍රියාකාරී වීමේදී මුහුණ දෙන ගැටළු හා පොදු සේවාවන් ලබා ගැනීමට යාමේදී මුහුණ දෙන ගැටළු වැනි අනුභූතීන් මෙම තේමාව යටතේ යොමු කරන තිර රචනාවන්හි අන්තර්ගත විය යුතුය.

**3.** මහා පරිමාණ දූෂණ වංචා සිදුවීම්

ඉහල පෙලේ නිලධාරීන් හා දේශපාලකයන් මිලියන ගණනින් මුදල් රටට අහිමි කිරීම/ වංචා කිරීම මෙම තේමාවෙන් විස්තර කෙරේ. මෙවැනි අපරාධ බොහෝ විට නීතියේ රැහැනට හසු නොවන අතර වැරදිකරුවන් කිසි විටෙක දඬුවම් නොලබයි. මෙවැනි මිලියන ගණනින් සිදු වන දූෂණ වංචා හේතුවෙන් රටේ ජනතාව කෙරෙහි ඇති කරන අහිතකර බලපෑම සහ එවැනි වංචා සහගත සිදුවීම් නීතිය හමුවට ගෙන ඒම සඳහා විවිධ පාර්ශවකරුවන් සතු වගකීම මෙම තේමාව යටතේ අන්තර්ගත විය යුතුය.

**ප්‍රතිලාභ**

චිත්‍රපට කර්මාන්තයේ ප්‍රවීනයන් සමගින් ක්‍රියාකාරී වැඩමුළුවකට සහභාගී වීමේ අවස්ථාව

ජයග්‍රාහී අයදුම්කරුවන් හට ඔවුන්ගේ කෙටි චිත්‍රපටය නිෂ්පාදනය කිරීමට හා අධ්‍යක්ෂණය කිරීමට අනුග්‍රහය ලැබෙනු ඇත.

ජයග්‍රාහී කෙටි චිත්‍රපට මහජන ප්‍රදර්ශනය උදෙසා තිරගත කරනු ඇත.

**අයදුම් කිරීම සඳහා උපදෙස් සහ නිර්ණායක**

තිර රචනා, සිංහල,දෙමළ හෝ ඉංග්‍රීසි භාෂාවලින් යොමු කල හැකිය

තිර රචනාවෙහි මුල පිටුව නිර්මාණයෙහි නම පමණක් සඳහන් කල යුතු අතර රචකයාගේ / රචකයින්ගේ නම් ඇතුළු වෙනත් කිසිදු විස්තරයක් අඩංගු නොවිය යුතුය.

අයදුම්කරුවන් වයස අවුරුදු 35 නොයික්ම විය යුතුය.

ඉදිරිපත් කරනු ලබන තිර රචනාවන් කතුවරයාගේ / කතුවරුන්ගේම නිර්මාණයන් විය යුතුය.

තිර රචනාවන් පී ඩී එෆ් ආකෘතියෙන්, "කෙටි චිත්‍රපට තරගාවලිය" ලෙසින් සඳහන් කර යන ඊ මේල් ලිපිනයට (tisl@tisrilanka.org) මෙහි සඳහන් අවසන් දින හෝ ඊට පෙර යොමු කරන්න

අයදුම්කරුවන් සම්බන්ධ කර ගත හැකි තොරතුරු (දුරකථන අංක / ලිපිනයන් සහ අනෙකුත් තොරතුරු ) ඊ මේලය තුල සඳහන් කරන්න

**විනිශ්චය කිරීම**

අයදුම් කරන ලද තිර රචනාවන් පහත සඳහන් නිර්ණායක පදනම් කර ගනිමින් විනිශ්චය කරනු ඇත.

1. සංකල්පය

2.අනුභූතිය

3.චරිත

4.දෙබස්

5.ව්‍යූහය

පළමු වටයේදී තෝරා,කෙටි ලැයිස්තු ගත කරන ලද අයදුම්කරුවන් සඳහා ක්‍රියාකාරී වැඩමුළුවක් සඳහා සහභාගී කරගනු ඇත.

එක් තේමාවක් යටතේ එක් තිර රචනාවක් ලෙස තේමා ත්‍රිත්වය යටතේ තිර රචනාවන් තුනක් තෝරා ගනු ලැබේ.

**කාල රාමුව**

අයදුම් කිරීම ආරම්භ වන දිනය - ඔක්තෝම්බර් 16

අයදුම්පත්‍ර භාර ගැනීමේ අවසන් දිනය - ඔක්තෝම්බර් 30

අල්ලස හා දූෂණය මැඩලීම පිලිබඳව සහ චිත්‍රපට නිර්මාණකරණය පිලිබඳ ක්‍රියාකාරී වැඩමුළුව - නොවම්බර් 07

ජයග්‍රාහී අයදුම්කරුවන් ප්‍රකාශයට පත් කිරීම - නොවැම්බර් 22

ජයග්‍රාහී කෙටි චිත්‍රපටි තිර ගත කිරීම - 2020 ජනවාරි 13

වැඩි විස්තර සඳහා අමතන්න

තරගයට අයදුම් කිරීම පිලිබඳ කිසියම් ගැටළුවක් වේ නම් කරුණාකර 0713018596 දුරකථන අංකය ඔස්සේ සාහිඩ් ආමන් ඇමතීමෙන් හෝ zaahid@tisrilanka.org ඊ මේල් ලිපිනය හරහා සම්බන්ධ වන්න.